උතුරු ප.රා.සේ.කො.සභා චක්‍රෙල්බ අංක **: 24/2024**

මගේ අංක :**NP/07/10/02/246**
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා,
උතුරු පළාත,
යාපනය
2024.08.21.

ලේකම්**,**අධ්‍යාපන අමාත්‍යාංශය**,**
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
උතුරු පළාත.

**උතුරු පළාත් පාසල් සේවක, පාසල් මුරකරු සෙවයේ** III **වන ශ්‍රේණිය**, II **වන ශ්‍රේණිය සහ** I **වන ශ්‍රේණියේ සේවකයන් සඳහා කාර්යක්ෂමතා කඩඉම විභාගය–** 2016 (I) 2024

---

උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරන ලද, දැනට බල පවත්වන උතුරු පළාත් පාසල් සේවක, පාසල් මුරකරු සෙවයේ යෙදී සිටින සේවකයන් සඳහා සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන වලට සහ එවට කලින් කලට සිදුකරන ලද සංශෝධනවලට අනුව පළාත් පාසල් සේවක, පාසල් මුරකරු සෙවයේ **III** වන ශ්‍රේණිය**, II** වන ශ්‍රේණිය සහ **I** වන ශ්‍රේණියේ සිටින නිලධාරීන් සඳහා 1වන,2වන,සහ 3වන,කාර්යක්ෂමතා කඩඉම් විභාගය උතුරු පළාතේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2024 වන වර්ෂයේ පැවැත්වීමට නියමිත බැවින් මෙයින් දන්වමි.

**2.0 සුදුසුකම්:**

ඉහත තනතුරුවල **III** ශ්‍රේණියේ නිලධාරීන් **1** වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා ද **II** ශ්‍රේණියේ නිලධාරීන් **2** වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා ද සහ **I** ශ්‍රේණියේ නිලධාරීන් **3** වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා ද අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

**3.0 අයදුම්පත්‍රය;**

3.1 අපේක්ෂකයන් මෙම චක්‍රලේඛය සමග අමුණා ඇති **තමන්ගේ තනතුර සහ ශ්‍රේණිවලට අදාල** අයදුම්පත්‍රය තමන්ගේ අත් අකුරින් සම්පූර්ණ කර තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් එවිය යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "**ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**, **උතුරු පළාත**, **අංක:** 393**/**48, **කෝවිල පාර**, **නල්ලූර්**, **යාපනය**." යනු ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනෙවිත් දෙන තැපැල් ක්‍රමය මඟින් ද එවිය යුතු අතර අයදුම්පතෙහි ඡායා පිටපතක් තමන් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

3.2 අයදුම්පත් එවිය යුතු ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ "NP/07/10/02/246" යනු කේත අංකය සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය දක්වා අයදුම්පත් යැවීම ප්‍රමාද කිරීමේ ප්‍රතිවිපාක සඳහා උතුරු පළාත් රාජ්‍ය සේවා

කොමිෂන් සභාව කිසිදු ආකාරයකින් වගකිව යුතු නොවේ. කෙසේ වෙතත්, අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් සහ අදාළ තොරතුරු පුරවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කර අදාළ නිලධාරීන්ට දැනුම් දෙනු ලැබේ.

3.3 අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය **2024.09.23** වේ.

**4.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය**:- තමන් ගන්නා වාචික පරීක්ෂණයේදී අධීක්ෂකවරයා සෑහීමකට පත්වන ලෙස තම අනන්‍යතාවය සනාථ කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටී. අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii) වලංගු ශ්‍රී ලංකික විදේශ ගමන් බලපත්‍රය (Passport)
(iii) වලංගු රියදුරු බලපත්‍රය (Driving License)

ඉහත සඳහන් ලියකිවිලිවල එකක් වත් ඉදිරිපත් නොකරන අපේක්ෂකයන්ගේ අපේක්ෂක හිමිකම අවලංගු තල හැක.

**5.0 විභාග ගාස්තු:-**

5.1 පළමු වරට මෙම විභාගය සඳහා අයදුම් කරන නිලධාරීන් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ.

5.2 වෙනත් අපේක්ෂකයින් එක් විෂයයක් සඳහා පමණක් අයදුම් කරන්නේ නම් රු. 250.00 ක් සහ විෂය එකකට වඩා අයදුම් කරන්නේ නම් රු. 500.00 ක් උතුරු පළාතේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකින් ගෙවිය යුතු අතර, "**ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත**". නමින් **යාපනය තැපැල් කාර්යාලයට** ගෙවිය යුතුය.

5.3 මෙම විභාගය සඳහා දැනටමත් අයදුම් කර ප්‍රවේශ පත්‍රයක් එවා ඇති සහ එම විභාගය සඳහා පෙනී නොසිටි අය අතර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විභාග ගාස්තුව මෙන් දෙගුණයක් ගෙවීමෙන් නිදහස් කල නොමැති අය එක් විෂයක් සඳහා පමණක් අයදුම් කරන්නේනම් රුපියල් 500.00 ක් සහ එක් විෂයයකට වඩා අයදුම් කරන්නේ නම් විභාග ගාස්තු රුපියල් 1000.00 ද විභාග ගාස්තු ලෙස ගෙවිය යුතුය දෙගුණ ලෙස විභාග ගාස්තු ගෙවීමෙන් නිදහස් කල අය 5.2 හි සඳහන් විභාග ගාස්තුව ගෙවිය යුතුය.

5.4 **ඉහත 5.2, 5.3 හි සඳහන් පරිදි විභාග ගාස්තු නොගෙවන අයදුම්කරුවන්ට නැවත විභාග ගාස්තුව ගෙවීමට සිදුවන බවත් සහ නැවත නිසි පරිදි විභාග ගාස්තු ගෙවීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් අගතියකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන ලෙසත් සැලකිල්ලට ගෙන විභාග ගාස්තුව ගෙවීම අනිවාර්ය වේ.**

5.5 අයදුම්කරු විසින් අදාල විභාග ගාස්තුව ගෙවා ඇති බව සහතික කිරීම අදාළ දෙපාර්තමේන්තු වල වගකීම වේ.

5.6 අයදුම්කරු මුදල් ඇණවුමේ ඡායා පිටපතක් තමන් සතුව තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. මෙම ගාස්තුව ආපසු නොගෙවන අතර වෙනත් කිසිදු විභාගයක් සඳහා ද මාරු කිරීමට නොහැක.

**6.0 ප්‍රවේශ පත්‍ර :**

නිසි පරිදි අයදුම්පත් ඉදිරිපත් කරන නිලධාරීන් වෙත උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. කෙසේ වෙතත්, අපේක්ෂකයෙකුට ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම ඔහු විභාගයට පෙනී සිටීම සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. සුදුසු හේතූන් මත විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම්වල වෙනස්කම් සිදුවිය හැකි බව ද සඳහන් කළ යුතුය. එසේම විභාගයට පෙනී සිටින නිලධාරීන්ට ඔවුන්ගේ අත්සන සහිත ප්‍රවේශ පත්‍ර විභාග පරීක්ෂක වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ නොදේ. විභාග දිනයට අවම වශයෙන් දින 7කට පෙර විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය නොලැබෙන ඕනෑම අපේක්ෂකයෙකු පහත විස්තර සමඟ වහාම **උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාට** දැනුම් දිය යුතුය.

- ඉල්ලීම් ලිපිය,
- අයදුම් පත්‍රයේ පිටපතක්,
- මුදල් ගෙවා ඇත්නම් ඇණවුම් පත්‍රෙය් සහතික කළ පිටපත,
- අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි අංකය, දිනය.
- ප්‍රවේශ පත්‍රය එවීමට අපේක්ෂාකරන ෆැක්ස් අංකය (Fax No)

**7.0 සහතික කිරීමේ නිලධාරියා සහ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා**

**7.1 සහතික කිරීමේ නිලධාරියා:-** විභාගය සඳහා අයදුම් කරන නිලධාරියා සේවය කරන කාර්යාලයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා / ඔවුන්ගේ ඊළඟ මාණ්ඩලික නිලධාරියා /දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් බලය පවරන ලද නිල මුද්‍රාව සහිත නිලධාරියෙකුට පමණි සහතික කිරීමේ නිලධාරියා ලෙස ක්‍රියා කර අයදුම් පත්‍රයට අත්සන් කළ හැක.

7.2 **දෙපාර්තමේන්තු ප්‍රධානියා** :- විභාගය සඳහා ඉල්ලුම් කරන නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව පවත්වාගෙන යන කාර්යාලයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා රාජකාරියට වගකියන අය/වෙනුවට රාජකාරි කටයුතු කරන අය පමණි දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස කටයුතු කර අයදුම්පතේ අත්සන් කල හැකිය

**සටහන :- අයදුම් පත්‍රය අත්සන් කිරීමට පෙර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2024 වෙත අවධානය යොමු කෙරේ.**

**8.0** මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන්ට නිවාඩු ලබා දීමේදී ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 19 වැනි වගන්තියට අනුව දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ.

**9.0** නිලධාරීන් විභාගය සුදුසුකම් ලැබීමට එක් එක් විෂය සඳහා අවශ්‍ය මුළු ලකුණු සංඛ්‍යාවෙන් අවම වශයෙන් සියට හතළිහක් (40%) අවශ්‍ය වේ.

**10.0** විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලත් සියලුම අයදුම්කරුවන් සඳහාම, උතුරු පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් විභාග අපේක්ෂකයන් වෙත ප්‍රතිඵල එවනු ලැබේ.

## 11.0 විෂය නිර්දේශය:-

**11.1** පාසල් සේවක, පාසල් මුරකරු සේවා ශ්‍රේණිය III හි සිටින අය සඳහා, කාර්යක්ෂමතා කඩඉම විභාගය පැවැත්වෙන අවස්ථාවේ නිලධාරීන් සම්බන්ධයෙන් පහත දැක්වන විෂයයන් වාචික පරීක්ෂණය අතරතුර පරීක්ෂා කරනු ලැබේ.

| විභාග නාමය | විෂය නිර්දේශය |
|---|---|
| **රාජ්‍ය පරිපාලනය සහ විෂය දැනුම** | අදාළ සේවකයා ඔහු සේවය කරන පාසලට පවරා ඇති කාර්යයන් පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් ලබා ඇති දැයි පරීක්ෂා කිරීම. (ලකුණු 30) |
| | සේවයට අදාළ සාමාන්‍ය කාර්යාල ක්‍රම සහ ආයතන පරිපාලන ක්‍රියා පටිපාටි පිළිබඳව දැනුමක් ලබා ඇති දැයි පරීක්ෂා කිරීම. (ලකුණු 30) |
| | නිලධාරියා වෙත පවරා ඇති විවිධ කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් සහ ප්‍රවීණතාවයන් ලබා ගෙන ඇති දැයි පරීක්ෂා කිරීම. (ලකුණු 40) |

**11.2** පාසල් සේවක, පාසල් මුරකරු සේවා ශ්‍රේණිය II හි සිටින අය සඳහා, කාර්යක්ෂමතා කඩඉම විභාගය පැවැත්වෙන අවස්ථාවේ නිලධාරීන් සම්බන්ධයෙන් පහත දැක්වන විෂයයන් වාචික පරීක්ෂණය අතරතුර පරීක්ෂා කරනු ලැබේ.

| විභාග නාමය; | විෂය නිර්දේශය |
|---|---|
| **රාජ්‍ය පරිපාලනය සහ විෂය දැනුම** | තමන්ගේ සේවයේ ශ්‍රේණියට අදාළ සාමාන්‍ය කාර්යාල ක්‍රම සහ ආයතන පරිපාලන ක්‍රියා පටිපාටි පිළිබඳව දැනුමක් ලබා ඇති දැයි පරීක්ෂා කිරීම. (ලකුණු 40) |
| | නිලධාරියා වෙත පවරා ඇති විවිධ කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් සහ ප්‍රවීණතාවයන් ලබා ගෙන ඇති දැයි පරීක්ෂා කිරීම. (ලකුණු 60) |

**11.3** පාසල් සේවක, පාසල් මුරකරු සේවා ශ්‍රේණිය I හි සිටින අය සඳහා, කාර්යක්ෂමතා කඩඉම විභාගය පැවැත්වෙන අවස්ථාවේ නිලධාරීන් සම්බන්ධයෙන් පහත දැක්වන විෂයයන් වාචික පරීක්ෂණය අතරතුර පරීක්ෂා කරනු ලැබේ.

| විභාග නාමය | විෂය නිර්දේශය |
|---|---|
| **රාජ්‍ය පරිපාලනය සහ විෂය දැනුම** | තමන්ගේ සේවයේ ශ්‍රේණියට අදාළ සාමාන්‍ය කාර්යාල ක්‍රම සහ ආයතන පරිපාලන ක්‍රියා පටිපාටි පිළිබඳව දැනුමක් ලබා ඇති දැයි පරීක්ෂා කිරීම. (ලකුණු 40) |
| | නිලධාරියා වෙත පවරා ඇති විවිධ කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් සහ ප්‍රවීණතාවයන් ලබා ගෙන ඇති දැයි පරීක්ෂා කිරීම. (ලකුණු 60) |

**12.0** තවද, එම චක්‍රලේඛය උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවිය වන www.np.gov.lk යන ලිපිනයේ Exam & Recruiments ⟶ Advertisement යන සම්බන්ධීකරණය මඟින් සම්බන්ධ කර ගත හැකි අතර, මෙම චක්‍රලේඛයේ විධිවිධාන පිළිබඳව ඔබගේ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ අමාත්‍යාංශවල කාර්යාලවල යටතේ ඇති අදාළ නිලධාරීන්ට දැනුම් දෙන ලෙසත් ඔබෙන් ඉල්ලා සිටිමි.

**අවධානයට :-**

1. **පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2024 හි අදාළ උපදෙස් පිළිපැදිය යුතුය.**
2. **මෙම විභාගය දැනුම් දීමෙන් සටහන් නොකරන කිසිදු කරුණක් සම්බන්ධයෙන් උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණය අවසාන තීරණය වේ.**
3. **තවද, මෙම කාරණය සම්බන්ධයෙන් කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍ය බව අපේක්ෂා කරන විට උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා විභාග අංශයේ දුරකථන අංක 021 - 221 9939 යන දුරකථන අංකය අමතන්න.**
4. **මෙම චක්‍රලේඛයේ භාෂා මාධ්‍යයන් අතර යම්කිසි අනුකූලතාවයන් දක්නට ලැබෙන අවස්ථාවකදී දෙමළ භාෂා මාධ්‍යයේ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කල යුතුය.**

**සී. තිරුවාකරන්,**
**ලේකම්,**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**උතුරු පළාත.**